**UNIVERSITY OF PERADENIYA**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 300 මට්ටම - 20
இளங்கலைமாணிப் பட்ட பரீட்சை (வெளிவாரி-புதிய பாடத்திட்டம்) 300 வது
தேர்ச்சி மட்டம் 2021

**Bachelor of Arts (External-New Syllabus) Examination 300 Level - 2021**

**ECNE 302- සංවර්ධන ආර්ථික විද්‍යාව**

**Instructions/ උපදෙස්:**

1. This paper contains **06** questions. Answer **FIVE questions only**. / මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 06ක් අන්තර්ගත වේ. **ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**
2. Marks will be deducted for illegible handwriting. / නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
3. Time: Three (3) hours. / කාලය : පැය තුනකි (3).

---

1. (a). Outline the major goals of development. / සංවර්ධනයේ ප්‍රධාන ඉලක්ක සඳහන් කරන්න. (ලකුණු 04)

   (b) Explain why it is important to study development economics. / සංවර්ධන ආර්ථික විද්‍යාව හැදෑරීමේ වැදගත්කම කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (c). "Evolution of the development thought shows a dynamic flow of new ideas". Discuss. / "සංවර්ධන චින්තනයේ විකාශය මගින් නව අදහස් මාලාවක ගතික ප්‍රවාහය පෙන්නුම් කරයි". සාකච්ඡා කරන්න. (ලකුණු 12)

2. (a). Distinguish between exogenous growth theory and endogenous growth theory. / බහිර්ජන්‍ය වෘද්ධි න්‍යාය සහ අන්තර්ජන්‍ය වෘද්ධි න්‍යාය වෙන් කොට දක්වන්න. (ලකුණු 06)

   (b). Explain the following development approaches:/ පහත සඳහන් සංවර්ධන ප්‍රවේශයන් පැහැදිලි කරන්න: (ලකුණු 06)
      (i) Dependency Theory / පරායත්ත න්‍යාය
      (ii) Urban Bias / නාගරික අභිනතිය

   (c). "Lewis's two-sector model is still applicable in explaining the growth experiences of many developing countries." Do you agree with this statement? Elaborate your answer. / "සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල වෘද්ධි අත්දැකීම් පැහැදිලි කිරීමේදී ලුවිස්ගේ ද්වි-ආංශික ආකෘතිය තවමත් යෝග්‍ය ආකෘතියක් වේ." ඔබ මෙම ප්‍රකාශය සමග එකග වේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

3. (a). "Developing countries struggle to overcome many development challenges under the COVID-19 Pandemic situation". Elaborate this statement by providing suitable examples from the real world./ "සංවර්ධනය වෙමින් පවතින රටවල් කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වය යටතේ බොහෝ සංවර්ධන අභියෝග පැරදවීමට බලවත් පරිශ්‍රමයක් දරයි". සත්‍ය ලෝකයෙන් සුදුසු නිදසුන් ලබා දෙමින් මෙම ප්‍රකාශය විස්තර කරන්න. (ලකුණු 10)

(b). Suggest proper policy recommendations to overcome the issues you mentioned in above Part (a). / උක්ත (a) කොටසෙහි ඔබ සඳහන් කළ ගැටළුවලින් මිදීමට සුදුසු ප්‍රතිපත්ති නිර්දේශයන් යෝජනා කරන්න. (ලකුණු 10)

4. (a). "The environmental degradation and depletion of natural resources create huge challenges in developing countries than in the developed countries". Do you agree? Why or why not? / "පාරිසරික හායනය සහ ස්වභාවික සම්පත් ක්ෂය වීම සංවර්ධිත රටවල්වලට වඩා සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට විශාල අභියෝග නිර්මාණය කරයි". ඔබ එකග වේද? එසේ එකග වන්නේ මන්ද? එකග නොවන්නේ මන්ද? (ලකුණු 10)

(b). Critically evaluate the following statement: "The gaps and the shortcomings of the Millennium Development Goals (MDGs) paved the way to the declaration of the Sustainable Development Goals (SDGs) by the United Nations." / පහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මකව අගය කරන්න : "සහශ්‍රක සංවර්ධන ඉලක්කවල පැවති පරතරයන් සහ දුර්වලතා මගින් එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත් කළ තිරසාර සංවර්ධන ඉලක්කවලට මග පෑදිනි." (ලකුණු 10)

5. (a). What is meant by "market failures"? Provide examples from the real world./ "වෙළෙඳපොළ අසමත්වීම්" මගින් කුමක් අදහස් වේද? සත්‍ය ලෝකයෙන් නිදසුන් ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

(b). What are the remedies available to a government to correct a market failure?/ වෙළෙඳපොළ අසමත්වීමක් නිවැරදි කිරීමට රජයකට ගත හැකි පිළියම් මොනවාද? (ලකුණු 06)

(c). Analyze the potential government failures associated with the government involvement in education sector in developing countries. / සංවර්ධනය වෙමින් පවතින රටවල්වල අධ්‍යාපන අංශයේ සිදුවන රජයේ මැදිහත්වීමක් හා සම්බන්ධව සිදුවිය හැකි රජයේ අසමත්වීම් විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

6. (a). What are the different measures of income inequality? / ආදායම් විශමතාවය මනිනු ලබන විවිධ මිණුම් මොනවාද? (ලකුණු 10)

(b). Explain the theoretical relationship between economic growth and income inequality. / ආර්ථික වෘද්ධිය සහ ආදායම් අසමානතාවය අතර සම්බන්ධතාවය න්‍යායාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(c). Outline the results of the recent empirical studies on inequality-growth nexus / ආදායම් විශමතාවය සහ ආර්ථික වෘද්ධිය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ මෑත කාලීන ආනුභවික අධ්‍යයනවල ප්‍රතිඵල දක්වන්න. (ලකුණු 05)

************************************